(01) කාමර උෂ්ණත්වයේදී සහ වායු ගෝලපීඩනයේදී ඝන, ද්‍රව වායු යන අවස්ථා තුනෙහිම පවතින මූල ද්‍රව්‍ය අඩංගු ආවර්තයක් හා ඛාණ්ඩයක් පිළිවෙලින් වන්නේ,

(1) 4 හා7 (2) 3 හා 5 (3) 4 හා 5 (4) 4 හා 5 (5) 2 හා 4

(02) $SO_3^{2-}$ අයන  ලෙස නිරූපණය කළ හැක. එහි බන්ධන කෝණයවිය හැක්කේ,

(1) $90^0$ (2) $107^0$ පමණ (3) $109^0$පමණ (4) $120^0$ පමණ (5) $180^0$

(03) පහත අණු අතරින් සමාන අවකාශයේ ව්‍යාප්තියක් දරණ අණු දෙකක් වන්නේ,

(A) $O_3$ (B) $SO_3$ (C) $NO_2$ (D) $CO_2$ (E) $BCl_3$

(1) A හා B (2) B හා C (3) D හා E (4) A හා C (5) C හා D

(04) එක්තරා අකාබනික සංයෝගයක් හඳුනා ගැනීමට යාමේදී එහි සුදු පැහැති ඝනයෙන් කොටසකට ජලය යොදන විට ජලය තුල අද්‍රාව්‍ය සුදු අවක්ෂේපයක් ලැබුණි. එයට ජලය තවදුරටත් යොදන විට සුදු අවක්ෂේප ප්‍රමාණය තව දුරටත් ඉහල යන ලදී. එයින් ලබාගත හැකි නිගමනය නම්,

(1) සංයෝගයේ AgCl විය හැකියි. (2) සංයෝගයේ $S_2O_3^{2-}$ අඩංගු විය හැකියි.

(3) සංයෝගයේ $Bi^{3+}$ අයන අඩංගු විය හැකියි. (4) සංයෝගයේ $SbCl_3$ විය හැකියි.

(5) කිසිදු නිගමනයකට ඒවාට නොහැකියි.

(05) ආවර්තිතා වගුවේ d කොටුවේ පළමුවන පේළියට අයත් මූල ද්‍රව්‍ය අතුරෙන් භූමි අවස්ථාවේදී $S^1$ වින්‍යාසය දරන පරමාණු පවතින මූලද්‍රව්‍ය සංඛ්‍යාව වන්නේ,

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

(06) පහත සඳහන් අණු සහ අයන අතුරින් එකම ජ්‍යාමිතික හැඩය හා සංයුජතා කවච සම්බන්ධයෙන් සම ඉලෙක්ට්‍රෝනික වන අනු හෝ අයන වන්නේ,

(A) $BeCl_2$ (B) $CO_2$ (C) HCN (D) $NO_2^+$ (E) $NCO^-$

(1) A හා B (2) B හා D (3) B, D හා C (4) A ,B, D හාE (5) ඉහත සියල්ලම.

(07) X- H....Y යනුවෙන් හයිඩ්‍රජන් බන්ධනයක් නිරූපණය කළ හැකිය. මේ නිරූපණය සම්බන්ධයෙන් පහත සඳහන් ඒවායින් සත්‍ය වන්නේ,

(1) X හි විද්‍යුත් ඝනත්වය Y හි විද්‍යුත් ඍණත්වයට වැඩි හෝ සමාන විය යුතුය.

(2) Y ඉලෙක්ට්‍රෝනවලින් පොහොසත් පරමාණුවක් විය යුතු නමුත් එය ඍණ අයනයක් විය නොහැකිය.

(3) XHY කෝණය සෑම විටම 180 ක් විය යුතුය.

(4) HXH බන්ධන විඝටන ශක්තිය H....Y බන්ධන විඝටන ශක්තියට වඩා වැඩි විය යුතුය.

(5) X හාY සෑමවිටම එකිනෙකට සමාන පරමාණු විය යුතුය.

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

(08) $MgCl_2$ (s) සෑදීමට අදාල සම්මත දැලිස් එන්තැල්පිය X වන අතර $Mg^{2+}_{(g)}$ හා $Cl^{-}_{(g)}$ යන ඒවායේ සම්මත සජලන එන්තැල්පි පිළිවෙලින් Y හා Z වේ. $MgCl_2(s)$ වල සම්මත ද්‍රාවණ එන්තැල්පිය වන්නේ.

(1) y + z - x (2) 2y + 2z - x (3) y + 2z - x (4) y + 2z - 2x (5) 2 (y + z - x)

(09) පරමාණුක අවසාන කවචවල ඉලෙක්ට්‍රෝන වින්‍යාසය $3d^{10}\ 4S^2\ 4P^6\ 5S^2$ වේ. එහි පරමාණුක ක්‍රමාංකය වන්නේ.

(1) 20 (2) 30 (3) 32 (4) 36 (5) 38

(10) වීදුරු බල්බයක පරිපූර්න වායුවක 10 g අඩංගුවේ. එම බල්බය තුල උෂ්ණත්වය $27^0C$ වන අතර අභ්‍යන්තර පීඩනය බාහිර වායුගෝල පීඩනයෙන් $\frac{1}{4}$ කි. බල්බය තුල පීඩනය බාහිර වායු ගෝල පීඩනය බවට පත් කිරීමට එයට $H_2(g)$ යොදන ලදී. ඒ සඳහා අවශ්‍ය වන්නේ $H_2(g)$ 0.6g නම් පරිපූර්ණ වායුවේ සා.අ.ස්. වන්නේ.

(1) 100 (2) 60 (3) 30 (4) 20 (5) 10

(11) 1.5 g $ml^{-1}$ වන HCl වාණිජ නිදර්ශකය 10 ml ක් ගෙන 100 ml දක්වා තනුක කර එයින් 25ml හා 0.5 $moldm^{-3}$ HCl 25 ml ක් මිශ්‍ර කරන ලදී. එම ද්‍රවනය සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීමට 1 $moldm^{-3}$ $Ca(OH)_2$ 25 ml වැය විය. ආරම්භක වාණිජ නිදර්ශකයේ පරිමාව අනුව සංශුද්ධතා ප්‍රතිශතය වන්නේ. (H= 1 Cl = 35.5)

(1) 10 (2) 50 (3) 25 (4) 36.5 (5) 37.5

(12) පහත සඳහන් වායුමය පරමාණු අතරින් ඉහළ පලමුවන අයනිකරණ ශක්තිය ඇත්තේ.

(1) Li (2) C (3) F (4) Br (5) Xe

(13) Mg ලෝහයෙන් 24 mg ස්කන්ධයක් වැඩිපුර තනුක $H_2SO_4$ අම්ල සමග ප්‍රතික්‍රියා කල විට 298 k හා 1 bar පීඩනයේදී ලැබෙන හයිඩ්‍රජන් වායුවේ පරිමාව ආසන්න වශයෙන්. (Mg = 24)

(1) 22 $Cm^3$ (2) 25 $Cm^3$ (3) 50 Cm3 (4) 224 $Cm^3$ (5) 250 $Cm^3$

(14) පහත සඳහන් කුමණ අනුවට හෝ අයනයට $I_3^-$ අයනයේ ජ්‍යාමිතික හැඩය තිබේද?

(1) $OF_2$ (2) $H_2O$ (3) $SO_2$ (4) $O_3$ (5) $NO_2^+$

(15) $3CdSO_4\,8H_2O$ සංයෝගය භාවිතා කර Cd සංයුතිය 25 ppm ද්‍රාවණයකින් 1 $dm^3$ ක් සෑදීම සඳහා අවශ්‍යවන එම සංයෝගයේ ස්කන්ධය වන්නේ ($3\,CdSO_4\,8H_2O$ = 768 Cd = 112)

(1) 11 mg (2) 19 mg (3) 25mg (4) $\phi$57 mg (5) 336 mg

(16) ආම්ලික මාධ්‍යයේදී $KMnO_4$ මගින් ඔක්සැලික් අම්ලය කාබන්ඩයොක්සිඩ් බවට ඔක්සිකරණය කල හැකිය. මෙහිදී $KMnO_4$ මවුල දෙකක් සමග ප්‍රතික්‍රියා කරන ඔක්සැලික් අම්ල මවුල ප්‍රමාණය වන්නේ.

(1) 1 (2) 3 (3) 5 (4) 7

(5)මින්කිසිවක් නොවේ.

(17) ඇසිටලීන් ($C_2H_2$) වල සම්මත දහන එන්තැල්පිය -1301 kJ $mol^{-1}$ වන අතර $CO_2$ (g) හා ජලයේ සම්මත උත්පාදන එන්තැල්පිය පිළිවෙලින් -394 kJ $mol^{-1}$ හා -286 $kJmol^{-1}$ වේ. ඇසිටලීන්වල සම්මත උත්පාදන එන්තැල්පි වන්නේ.

(1) 114 $kJmol^{-1}$ (2) 227 $kJmol^{-1}$ (3) 621 $kJmol^{-1}$ (4) 1981 $kJmol^{-1}$ (5) 2375 $kJmol^{-1}$

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

(18) ආවර්තිතා වගුවේ දෙවන කාණ්ඩයේ මූල ද්‍රව්‍ය සාදන සංයෝගවල ගුණ සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ වලින් අසත්‍ය වන්නේ,

(1) කාණ්ඩයේ පහලට යන විට සල්ෆේටවල ද්‍රාව්‍යතාව අඩුවේ.

(2) කාණ්ඩයේ පහලට යන විට හයිඩ්‍රොක්සයිඩවල ද්‍රාව්‍යතාව අඩුවේ.

(3) කාණ්ඩයේ පහලට යන විට කාබනේටවල තාප වියෝජනය වන උෂ්ණත්වය අඩු වේ.

(4) මේවායේ නයිට්‍රේට හොඳින් ද්‍රාව්‍යයි.

(5) කාණ්ඩයේ පහලට යන විට ක්‍රෝමේටවල ද්‍රව්‍යතාව අඩුවේ.

(19) $^{60}_{27}CO$ පරමාණුවක් විකිරණශීලතාවයේ ඵලයක් ලෙස $\beta$ කිරණයක් නිකුත් කිරීමෙන් ලැබෙන නියුක් ලයිඩය වන්නේ.

(1) $^{57}_{27}CO$ (2) $^{60}_{28}Ni$ (3) $^{61}_{28}Ni$ (4) $^{60}_{29}Cu$ (5) මින් කිසිවක් නොවේ.

(20) $[Fe(OH)_2(H_2O)_4]$ Br යන සංකීර්ණ සංයෝගයේ IUPAC නාමය වන්නේ.

(1) Tertaaquadi hydroxidoiron(III) bromide.

(2) Tertaaquadi hydroxidoiron(II) bromide.

(3) Dihydroxidotetra aquairon(III) bromide.

(4) Dihydroxidotetra aquairon(II) bromide.

(5) Tetra aquadihqydroxoiron(II) bromide.

(21) පහත අයන අතරින් විශාලම අරය සහිත ප්‍රභේදය වන්නේ.

(1) $O^{2-}$ (2) $S^{2-}$ (3) $N^{3-}$ (4) $H^{-}$ (5) $Cl^{-}$

(22) ආම්ලික $KMmO_4$ හි දම් පැහැය විවර්ණය නොකරන ප්‍රභේදය වන්නේ.

(1) $SO_2$ (2) $Na_2SO_3$ (3) $FeCl_2$ (4) $H_2SO_4$ (5) $H_2O_2$

(23) X නැමැති අකාබනික සංයෝගය.

(1) තනුක $NH_4OH$ හි අවක්ෂේපයක් ලබාදෙන අතර සාන්ද්‍ර $NH_4OH$ යෙදූ විට එම අවක්ෂේය දියවේ.

(2) තනුක NaOH හි අවක්ෂේපයක් ලබා දෙන අතර සාන්ද්‍ර NaOH හි එය ද්‍රාවණය වේ.

X හි අඩංගු කැටායනය වන්නේ.

(1) $Ni^{2+}$ (2) $Cu^{2+}$ (3) $Fe^{2+}$ (4) $Zn^{2+}$ (5) $Fe^{3+}$

(24) 25°C දී වායුමය ඇසිටලීන් හා ද්‍රව බෙන්සීන් හි සම්මත උත්පාදන එන්තැල්පි පිළිවෙලින් -280 $kJmol^{-1}$ හා -760 $kJmo^{l-}$ වේ.

$3C_2H_2(g) \rightarrow C_6H_6(l)$ යන ප්‍රතික්‍රියාවේ ප්‍රතික්‍රියා තාපය වන්නේ ($kJ\ mol^{-1}$)

(1) -80 (2) -160 (3) +80 (4) +160 (5) -240

(25) ආවර්තිතා වගුවේ d ගොනුවේ පලමු පේළියට අයත් මූල ද්‍රව්‍ය අතරින් පිළිවෙලින් පහත්ම හා ඉහලම අයනීකරණ ශක්ති බලාපොරොත්තු විය හැක්කේ පහත සඳහන් කුමන යුගලයටද?

(1) $S_c$ හා Mn (2) Ti හා Cu (3) $S_c$ හා Zn (4) Cu හා Zn (5) Cr හා Cu

(26) ක්ෂාරීය මාධ්‍යයේදී $Cr^{3+}$ අයන $H_2O_2$ මගින් ඔක්සිකරනයෙන් ලබාගත හැකි ද්‍රාවණයේ වර්ණය වන්නේ.

(1) කොලපාට (2) කහපාට (3) දම්පාට (4) තැඹිලිපාට (5) නිල්පාට

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

(27) $H_2S$ හි S වල මුහුම් කරන අවස්ථා වන්නේ.

(1) SP මුහුම් කරණයයි.  (2) $SP^2$ මුහුම් කරණයයි.  (3) $SP^3$ මුහුම් කරණයයි.

(4) $SP^3d$ මුහුම් කරණයයි.  (5) $SP^3d^2$ මුහුම් කරණයයි.

(28) ක්ෂාර ලෝහ සම්බන්ධයෙන් නොගැලපෙන්නේ.

(1) ඒවා ක්ෂාර පාංශු ලෝහ තරම් ප්‍රතික්‍රියාශීලී නැත.

(2) ඒවායේ දෙවන අයනීකරණ ශක්තිය ඉහළය.

(3) කාණ්ඩයේ පහලට යන විට ද්‍රවාංකය අඩුවේ.

(4) ඉහල මූල ද්‍රව්‍ය වලට වඩා පහල මූල ද්‍රව්‍ය වේගයෙන් ජලය හා ප්‍රතික්‍රියා කරයි.

(5) කාණ්ඩය පහලට යන විට විද්‍යුත් ඍණතාව අඩුය.

(29) $NaoH_{(aq)}$ යූරියා සමඟ ප්‍රතික්‍රියා කර $NH_{3(aq)}$ සාදයි. යූරියා 0.6g හා 1 $moldm^{-3}$ NaOH 100ml සමඟ ප්‍රතික්‍රියා කරවූ විට ලැබෙන ද්‍රාවණය සමඟ $BaCl_{2(aq)}$ වැඩිපුර යෙදූ විට ලැබෙන අවක්ෂේප ස්කන්ධය වන්නේ. (Ba = 137 C = 12 O = 16)

$2NaOH_{(aq)} + (NH_2)_2CO_{(s)} \rightarrow Na_2CO_{3(aq)} + 2NH_{3(g)}$

(1) 19.9g  (2) 1.97g  (3) 3.94g  (4) 39.4g  (5) 9.85g

(30) මින් කුමන ඔක්සයිඩය උභයගුණී ලක්ෂණ දරයිද?

(A) $Al_2O_3$  (B) BeO  (C) $Fe_2O_3$  (D) $P_2O_5$  (E) $Na_2O$

(F) $K_2O$  (G) $Li_2O$  (H) SnO  (I) $Cr_2O_3$  (J) ZnO

(1) ABC  (2) DEH  (3) HJC  (4) AHJ  (5) DEF

- (31) සිට (40) දක්වා ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නයේ දක්වා ඇති (a), (b), (c), (d) යන ප්‍රතිචාර අතරින් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය/ ප්‍රතිචාර කවරේදැයි තෝරාගෙන පහත සටහන පරිදි ලකුණු කරන්න.

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| (a) හා (b) පමණක් නිවැරදි ය. | (b) හා (c) පමණක් නිවැරදි ය. | (c) හා (d) පමණක් නිවැරදි ය. | (d) හා (a) පමණක් නිවැරදි ය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදි ය. |

(31) වර්ණවත් ඔක්ෂිකාරකවල වර්ණය වෙනස් කල හැක්කේ.

(a) $FeCl_3$  (b) $CaSO_3$  (c) KI  (d) $SnCl_2$

(32) පහත කුමන ක්‍රියාවලි / ක්‍රියාවලිය තාප අවශෝෂකද?

(a) $Na^+_{(g)} + Cl^-_{(g)} \rightarrow NaCl(s)$  (b) $Cl_{(g)} + e \rightarrow Cl^-_{(g)}$  (c) $Na_{(g)} \rightarrow Na^+_{(g)} + e$  (d) $Cl_{2(g)} \rightarrow 2Cl_{(g)}$

(33) මවුලය සඳහා නිවැදි අර්ථ දක්වීමක් වන්නේ.

(a) $^{12}_{6}C$ සමස්ථානිකයේ 12.00g තුළ අඩංගු $^{12}_{6}C$ පරමාණු සංඛ්‍යාවයි.

(b) $^{23}Na$ 23g තුල අඩංගු Na පරමාණු සංඛ්‍යාවයි. (Na =22.9)

(c) F ෆැරඩේ එකක ආරෝපණයක අඩංගු e සංඛ්‍යාවයි.

(d) H (H=1.01) [illegible]

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

(34) විදුරු බල්බයක $1\times10^5$ $Nm^{-2}$ පීඩනයක් යටතේ $H_{2(g)}$ ප්‍රමාණයක් එක්තරා උෂ්ණත්වයකදී අඩංගුය. එය තුල පීඩනය $2.5\times10^5$ $Nm^{-2}$ පීඩනයක් වන තුරු $He_{(g)}$ යොදන ලදී. භාජනය තුල ඇති $H_{2(g)}$ හා $He_{(g)}$ පිළිබඳව නිවැරදි වන්නේ.

(a) $\frac{P_{H_2}}{P_{He}} = \frac{2}{5}$ (b) $\frac{N_{H_2}}{N_{He}} = \frac{2}{3}$ (c) $\frac{P_{He}}{P_{H_2}} = \frac{3}{2}$ (d) $X_{H_2} = \frac{2}{3}$

(35) $SrCl_{2(aq)}$ ද්‍රාවණයක් හා කුමන ද්‍රාවණ / ද්‍රාවනය යෙදූවිට අවක්ෂේප ලැබේද?

(a) $AgNO_3$ (b) $H_2SO_4$ (c) $Na_2CO_3$ (d) $H_3PO_4$

(36) වායුවක වර්ග මධ්‍යන්‍ය මූල වේගය (u) සම්බන්ධයෙන් මින් කුමක් / කුමන ඒවා සත්‍යවේද?

(a) වායුවේ නිරපේක්ෂ උෂ්ණත්වය දෙගුණ කල විට $u^2$ දෙගුණ වේ.
(b) වායුවේ පීඩනය දෙගුණ කල විට u දෙගුණවේ.
(c) වායුවේ පරිමාව දෙගුණ කල විට u හි අගය අඩක්වේ.
(d) එකම උෂ්ණත්වයේදී සෑම වායුවක් සඳහාම u එකම අගයක් වේ.

(37) පහත සඳහන් කුමන විපරයාසය / විපර්යාස වල ඵලයක් ලෙස S ලබා දෙයිද?

(a) $Na_2S$ ද්‍රාවණයකට තනුක HCl එකතු කිරීම.
(b) $Na_2S_2O_3$ ද්‍රාවණයකට තනුක $H_2SO_4$ එකතු කිරීම.
(c) ජලීය Fe (III) අයන ද්‍රාවණයක් තුලින් $H_2S$ වායුව බුබුලනය කිරීම.
(d) $Na_2SO_4$ ද්‍රාවණයට HCl එකතු කිරීම.

(38) පහත සඳහන් ප්‍රතික්‍රියා වලින් කුමක් / කුමන ඒවා සත්‍යවේද?

(a) නයිට්‍රයිට අයන අඩංගු ද්‍රාවණයක පවතින නයිට්‍රේට් අයන හඳුනා ගැනීම සඳහා දුඹුරු වලය පරීක්ෂාව සිදුකළ හැකිය.
(b) කාබනේට් අයන අඩංගු ද්‍රාවණයක පවතින සල්ෆේට් අයන හඳුනා ගැනීම සඳහා එයට වැඩිපුර තනුක HCl සමග $BaCl_2$ යොදා පරීක්ෂා කල හැකිය.
(c) සල්ෆේට් අඩංගු ද්‍රාවණයක් පවතින ක්ලෝරයිඩ අයන හඳුනා ගැනීම සඳහා එයට තනුක $HNO_3$ හා $AgNO_3$ දමා පරීක්ෂා කල හැකිය.
(d) අයඩයිඩ අයන ද්‍රාවණයක අඩංගු ක්ලෝරයිඩ අයන හඳුනා ගැනීම සඳහා එයට තනුක $HNO_3$ හා $AgNO_3$ යොදා පරීක්ෂා කල හැකිය.

(39) පහත සඳහන් ඒවායින් කුමක් / කුමන ඒවා සත්‍යවේද?

(a) පලමු කාණ්ඩයේ සියළුම ලෝහ $N_2$ සමග පහසුවෙන් නයිට්‍රයිඩ සාදයි.
(b) mg ලෝහය හුමාලය සමග ප්‍රතික්‍රියා කොට ප්‍රධාන ඵලය ලෙස මැග්නීසියම් හයිඩ්‍රොක්සයිඩ ලබාදේ.
(c) ලෝහ හයිඩ්‍රයිඩ ජලය සමග ප්‍රතික්‍රියාවෙන් $H_2$ ලබාදේ.
(d) S ගොනුවේ සියළුම මූලද්‍රව්‍ය වල ක්ලෝරයිඩ හා නයිට්‍රේට ජලයේ ද්‍රාව්‍යයි.

(40) පහත සඳහන් ඒවායින් කුමක් / කුමන ඒවා සත්‍යවේද?

(a) $H_2O_2$ ද්‍රාවනයක් ඔක්සිකරනය කිරීමට ක්ලෝරීන් අසමත්වේ.
(b) $MnSO_4$ ද්‍රාවනයට $NH_3$ එකතු කිරීමෙන් ලැබෙන අවක්ෂේපය වැඩිපුර $NH_3$ වල දියවේ.
(c) ආම්ලික ඩයික්‍රෝමේට් ද්‍රාවනයක් තුලින් $H_2S$ වායුව බුබුලනය කල විට අවක්ෂේපයක් ලැබේ.
(d) ෆ්ලුවොරීන් ජලය සමග [illegible]

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

* (41) සිට (50) දක්වා ප්‍රශ්නවල වගන්ති දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති වගන්ති යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දක්වෙන (1), (2), (3), (4) සහ (5) යන කවර විස්තරය දැයි තෝරා ලකුණු කරන්න.

| ප්‍රතිචාරය | පළමුවැනි වගන්තිය | දෙවන වගන්තිය |
|---|---|---|
| 1 | සත්‍ය ය. | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා දෙයි. |
| 2 | සත්‍ය ය. | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා නොදෙයි. |
| 3 | සත්‍ය ය. | අසත්‍ය ය. |
| 4 | අසත්‍ය ය. | සත්‍ය ය. |
| 5 | අසත්‍ය ය. | අසත්‍ය ය. |

| පළමුවැනි වගන්තිය | දෙවන වගන්තිය |
|---|---|
| (41) $Fe^{3+}$ වැඩිපුර ජලීය ඇමෝනියා සමඟ සාදන අවක්ෂේපය වැඩිපුර ජලීය ඇමෝනියා හි අද්‍රාව්‍යය | $Fe^{3+}$ අයනය උභයගුණි අයනයක් ලෙස හැසිරේ. |
| (42) සියලුම ලෝහ ඔක්සයිඩ භාෂ්මිකය. | ලෝහ ඔක්සයිඩ අම්ල සමඟ ප්‍රතික්‍රියා කරයි. |
| (43) පරිපූර්ණ වායුන්ට පහල උෂ්ණත්ව හා ඉහල පීඩනවලදී වැන්ඩවාල්ස් සමීකරණය යෙදිය යුතුය. | පහල උෂ්ණත්ව හා ඉහල පීඩනවලදී වායු අපරිපූර්ණ තත්වයට වඩා ලැබේ. ලං ජේ. |
| (44) අයිස්වල ද්‍රවාංකය ඝන $I_2$ වල ද්‍රවාංකයට වඩා පහත්ය | $I_2$ අනු අතර දුර්වල වැන්ඩවාල් බල පවතින අතර ජල අනු අතර ප්‍රබල හයිඩ්‍රජන් බන්ධන පවතී. |
| (45) ආම්ලික ජලීය $K_2Cr_2O_7$ ද්‍රාවනයකින් පොඟවන ලද පෙරහන් කඩදාසියක් $SO_2$ වායුව මගින් කොල පැහැයට හරවයි. | ජලීය $[Cr(H_2O)_6]^{3+}$ අයනය කොල පැහැතිය. |
| (46) Ca ලෝහය Na ලෝහයට වඩා පහසුවෙන් ජලය සමඟ ප්‍රතික්‍රියා කරයි. | Ca ලෝහයේ ඝනත්වය Na ලෝහයේ ඝනත්වයට වඩා අඩුය. |
| (47) $O^{2-}$ අයනය F පරමාණුවට වඩා ප්‍රමාණයෙන් විශාලය. | ඕනෑම ඍණ අයනයක් එහි උදාසීන පරමාණුවට වඩා විශාලය. |
| (48) 18 වන කාණ්ඩයේ පහලට යන විට වායු මූල ද්‍රව්‍ය පරමාණු වල කාමර උෂ්ණත්වයේදී මධ්‍යන්‍ය වේගය අඩුවේ. | විශාල වායු පරමාණු කුඩා පරමාණුවලට වැඩියෙන් පරිපූර්ණ හැසිරීමෙන් අපගමණය වේ. |
| (49) නයිට්‍රජන්වල ඔක්සිකරණ අංකය ශුන්‍ය සිට -3 දක්වා වෙනස් කිරීමට ඇතැම් ලෝහ වලට හැකියාව ඇත. | $NH_3$ සංයෝගයේ දී N වල ඔක්සිකරන අංකය -3 වේ. |
| (50) $NCl_3$ හා $PCl_3$ යන සංයෝග දෙකම ජල විච්ඡේදනයෙන් HCl ලබා දෙයි. | N හා P යන දෙකම Cl වලට වඩා සැලකිය යුතු තරම් පහත් විද්‍යුත් සෘණතා පෙන්වයි. |

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras